## 1. සාමාන්‍ය කොරියානු භාෂා ප්‍රවීණතා පරීක්ෂණය (Normal EPS Topik)

**අවශ්‍ය සුදුසුකම්**

- වයස් සීමාව අවුරුදු 18 සහ 39 අතර වීම
- අයදුම්කරුවන් සිරගතවීමක් හෝ බරපතල දඬුවමකට ලක්වී නොසිටීම.
- අයදුම්කරුවන් සඳහා කොරියානු ජනරජයෙන් පිටුවහල් කිරීමේ හෝ පිටත්වීමේ නියෝග වාර්තාවක් නොතිබීම. කොරියාවේ නීති විරෝධී ලෙස එක් දිනක් හෝ රැඳී නොසිටීම.
- අයදුම්කරුවන් ශ්‍රී ලංකාවෙන් පිටත්වීමේ තහනමකට ලක්නොකොට තිබීම.
- අයදුම්කරුවන් වර්ණ අන්ධතාවයෙන් හෝ වර්ණ දුර්වලතාවයෙන් තොර විය යුතුය.
- E-9 හා E-10 වීසා කාණ්ඩය යටතේ වසර 05ක් හෝ ඊට වැඩි කාලයක් කොරියාවේ සේවයේ යෙදී සිටි පුද්ගලයින් හට මේ සඳහා ඉල්ලුම් කළ නොහැක.

**ක්‍රමවේදය**

- කොරියානු භාෂා පරීක්ෂණය පරිගණක ආශ්‍රිතව මාර්ගගත ක්‍රමවේදය හරහා පමණක් පැවැත්වේ . භාෂා පරීක්ෂණය සමත් වන අයදුම්කරුවන් නිපුණතා පරීක්ෂණයකට හා කුසලතා පරීක්ෂණයකට යොමු කර ඉන් අනතුරුව සම්මුඛ පරීක්ෂණයට යොමු කෙරේ.

- වෛද්‍ය පරීක්ෂණ වාර්තාව හා නිරවුල් පොලිස් වාර්තාවක් ලැබුණු පසු ලිපිගොනුව සම්පූර්ණ කර එම තොරතුරු කොරියානු රැකියා වෙබ් අඩවියට ලියාපදිංචි කරනු ලැබේ.

- කොරියානු රැකියා වෙබ් අඩවියෙහි ලියාපදිංචි කරන ලද අයදුම්කරුවන් සඳහා පමණක් දකුණු කොරියානු රජයේ සේවා යෝජකයින්ගේ තේරීම මත සේවා ගිවිසුමක් නිකුත් කරනු ලැබේ.

- සේවා ගිවිසුමක් අත්සන් කරනු ලැබූ අයදුම්කරුවන් පෙර විගමණික පුහුණුවක් සඳහා යොමු කර අවශ්‍ය ලේඛණ සම්පූර්ණ කල පසු විදේශ ගත වීම සිදු වේ.

**මෙම ක්‍රමවේදය යටතේ දකුණු කොරියාව වෙත පිටත් වන රැකියාලාභියෙකු විසින් පහත සඳහන් ගාස්තු කාර්යාංශය වෙත ගෙවීම් කල යුතුය.**

පෙර විගමණික පුහුණු ගාස්තුව
වීසා ගාස්තුව
බඳවාගැනීමේ ගාස්තුව
කාර්යාංශ ලියාපදිංචි ගාස්තුව